**උද්භිද උද්‍යාන භාර අරමුදල - 2016**

-----------------------------------------

උද්භිද උද්‍යාන භාර අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා භාණ්ඩාගාරයේ ලේකම්, කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශයේ ලේකම්, උද්භිද උද්‍යාන අධ්‍යක්ෂ, මහා භාණ්ඩාගාරයේ අයවැය අධ්‍යක්ෂ සහ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් අතර, 1996 දෙසැම්බර් 20 දින එළඹෙන ලද ගිවිසුමෙහි (4)(ජේ) ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට උද්භිද උද්‍යාන භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලින් ආවරණය නොවන ඉදිකිරීම් සහ සංවර්ධන වියදම් ගිණුම්ගත කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 13 වගන්තිය අනුව මූල්‍ය ප්‍රකාශනවල සෑම ප්‍රමාණාත්මක හා සමාන අයිතම පන්තියක්ම වෙන වෙනම ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ රු.3,887,001 කට මිලදී ගත් පරිගණක හා උපාංග යාන්ත්‍රික උපකරණ යටතේ දක්වා තිබුණි. මේ නිසා පරිගණක උපාංග හා යාන්ත්‍රික උපකරණ එකම ක්ෂය අනුපාතයක් යටතේ ක්ෂය කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) 2016 වර්ෂයේ හක්ගල උද්භිද උද්‍යානයේ නඩත්තු කටයුතු වෙනුවෙන් කොන්ත්‍රාත් කම්කරුවන් වෙත ගෙවන ලද රු.960,453 ක අයභාර වියදම්, ඉඩම් සංවර්ධන යටතේ ප්‍රාග්ධනිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා උපදේශන සේවා සැපයීමට අදාළ ගෙවිය යුතු රු.120,000 ක ගාස්තුව ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ගම්පහ උද්භිද උද්‍යානයේ පැළ ගෘහය ඉදිකිරීම වෙනුවෙන් ලබාදුන් රු.4,643,510 ක අත්තිකාරම් මුදල දෝෂ සහගත ලෙස ගොඩනැගිලි සංවර්ධන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ මල් වගා පොත් හා මාර්ගෝපදේශ පත්‍රිකා අවසාන තොගය රු.1,079,773 ක් අඩුවෙන් ගැලපීම සමාලෝචිත වර්ෂයේදී නිවැරදි නොකිරීම නිසා ආරම්භක තොගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.3 අවිනිශ්චිත ගිණුම**

2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පැවති රු.5,180ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනා ගැනීමකින් තොරව හා ජ්නල් සටහන් යොදා නොගෙන සමාලෝචිත වර්ෂයේදී අවිනිශ්චිත ගිණුම හර කර ඉකුත් වර්ෂයේ ඉදිරියට ගෙනා අතිරික්තයට බැර කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් කටයුතුවලින් රු.152,235,357ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.121,905,252 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.30,330,105 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 04 ක ආදායම රු.62,098,721 කින් වැඩිවීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2017 ජුනි 15 දිනය.

**5. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් පාලනය | (i) සියලු විස්තර ඇතුළත් කර ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු නොකිරීම.<br>(ii) වත්කම් නිවැරදිව වර්ගීකරණය කර නිවැරදි වටිනාකම් ගිණුම්ගත නොකිරීම. |
| (ආ) තොග පාලනය | (i) තොග ලැබීම් හා නිකුත් කිරීම් නිසි පරිදි වාර්තාගත නොකිරීම.<br>(ii) තොග භෞතික සත්‍යාපනය නොකිරීම. |
| (ඇ) ණයගැති හා ණයහිමි පාලනය | (i) ගිණුම් කාල පරිච්ඡේදයට අදාල ණයගැතියන් හා ණයහිමියන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම.<br>(ii) ණයගැති හා ණයහිමි ශේෂ අප්‍රමාදව නිරවුල් නොකිරීම. |